# විශේෂ සටහන

මෙම පාරිසරික බලපෑම් ඇගයුම් වාර්තාව පිළියෙළ කරන ලද්දේ ඉහළ ඇලහැර ඇල මාර්ගයේ සැලසුමට අදාළ වශයෙනි. 2015 ජුලි මස 14 වන දින පවත්වන ලද රැස්වීමකදී, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලිපි ගොනු අංක IWRM /TS/02/92/NCP/Design හා 2015 ජූලි 09 දින දරණ ලිපිය මගින් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වනජිවින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ඉහළ ඇලහැර ඇලේ කිමි 23 +265 සිට කිමි 27+310 දක්වා කොටස වැසූ කුටීරයක් ලෙස සැලසුම් කරන ලෙස කර ඇති ඉල්ලීමට සැලසුම් ඉංජිනේරුවන් එකඟතාවය පළ කොට ඇත. ඒ අනුව, ඉහළ ඇලහැර ඇලේ කිමී 23 +265 සිට  කිමී 27+310 තෙක් කොටස වැසූ කුටීරයක් ලෙස සැලසුම් කරනු ලැබ ඇති අතර එසේ ඉදිකිරීමට කටයුතු කරනු ඇත. මෙම සටහන මගින් පාරිසරික ඇගයුම් වාර්තාවේ එම ඇල කොටසට අදාළ කරුණු, ඇමුණුම්, හා සිතියම්ද උප ග්‍රන්ථ ආදිය අවලංගු කෙරේ.